# පොලිස් මාධ්‍ය කොට්ඨාසය

**பொலிஸ் ஊடகப் பிரிவு**

**POLICE MEDIA DIVISION**

**14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල**

| දිනය Date | 2025.03.07 පැය 1530 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/467 /2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |
|---|---|---|---|---|---|---|---|


**ප්‍රධාන කර්තෘ / ප්‍රවෘත්ති කර්තෘ,**
**අධ්‍යක්ෂ ප්‍රවෘත්ති / ප්‍රවෘත්ති කළමණාකරු,**
**සියළුම මාධ්‍ය ආයතන.**

**පොලිස් භාරයට ගනු ලබන ගිනි අවි හා අත් බෝම්බ සඳහා ගෙවනු ලබන ත්‍යාග මුදල වැඩි කිරීම - පොලිස් මූලස්ථානය.**

මෑත කාලීනව වාර්තා වූ අපරාධ සම්බන්ධව සලකා බැලීමේදී දිවයින තුල නීති විරෝධී ගිනි අවි සහ අත් බෝම්බ තව දුරටත් සංසරණය වන බව නිරීක්ෂණය වන බැවින් අපරාධ මැඩපවත්වා මහජනතාවට අපරාධ බියකින් තොරව ජීවත් විය හැකි සාමකාමී පරිසරයක් බිහි කිරීම සඳහා පුළුල් වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට ශ්‍රී ලංකා පොලිසිය සැලසුම් කර ඇත.

මෙහි එක් පියවරක් ලෙස නීති විරෝධී ගිනි අවි හා අත් බෝම්බ අත්අඩංගුවට ගැනීමේ මෙහෙයුම් තවදුරටත් සිදු කරමින් පවතින අතර, ඒ සඳහා සියළු පොලිස් නිලධාරින් හා පුද්ගලික ඔත්තුකරුවන් දිරි ගැන්වීමට පොලිස් ත්‍යාග අරමුදලින් ගෙවනු ලබන ත්‍යාග මුදල පහත පරිදි වැඩිකිරීමට තීරණය කර ඇත

| අවි වර්ගය | ගෙවනු ලබන ත්‍යාග මුදල | | | |
|---|---|---|---|---|
| | සැකකරුවෙකු සමඟ ගිනි අවි/ අත්බෝම්බ අත්අඩංගුවට ගැනීමේදී (රු) | | සැකකරුවෙකු නොමැතිව ගිනි අවි/අත්බෝම්බ අත්අඩංගුවට ගැනීමේදී (රු) | |
| | නිලධරයන්ට | පුද්ගලික ඔත්තුකරුවන්ට | නිලධරයන්ට | පුද්ගලික ඔත්තුකරුවන්ට |
| ටී. 56 | 1,000,000 | 750,000 | 750,000 | 500,000 |
| පිස්තෝල | 400,000 | 350,000 | 350,000 | 300,000 |
| රිවෝල්වර් | 300,000 | 250,000 | 200,000 | 150,000 |
| විදේශයන්හි නිෂ්පාදිත ස්වයංක්‍රීය නොවන වෙනත් අවි | 150,000 | 100,000 | 100,000 | 75,000 |
| රිපීටර් තුවක්කු | 100,000 | 75,000 | 50,000 | 30,000 |
| විදේශීය නිෂ්පාදිත පතොරොම් තුවක්කු | 50,000 | 30,000 | 30,000 | 20,000 |
| මෙරට නිෂ්පාදිත වෙනත් ඕනෑම තුවක්කුවක් | 30,000 | 20,000 | 25,000 | 15,000 |
| විදේශීය නිෂ්පාදිත අත්බෝම්බ | 50,000 | 30,000 | 30,000 | 20,000 |

එමෙන්ම මෙම ගිනි අවි හා අත් බෝම්බ සම්බන්ධ තොරතුරු ලබා දෙන පුද්ගලයින්ගේ රහස්‍යභාවය ආරක්ෂා කිරීමට ශ්‍රී ලංකා පොලිසිය කටයුතු කරන අතර මේ සම්බන්ධව තොරතුරු වෙතොත් පොලිසිය දැනුවත් කරන ලෙස ශ්‍රී ලංකා පොලිසිය මහජනතාවගෙන් ඉල්ලා සිටියි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය**